දිවි තොර කරගැනීම් යනු සමාජ ගැටළුවක් බැවින්, ඒ සම්බන්ධයෙන් සමාජය යහපත් ලෙසින් දැනුවත් කිරීම අවශ්‍ය වේ. කෙසේ නමුත් එවැනි දැනුවත් කිරීමක දී පුවත් මාධ්‍යයන්ට අතිශයින්ම ප්‍රවේසම් වීමට සහ ඒ පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වීමට සිදුවේ.

මෙවැනි ලිපියක් සමගින් පුවත් හදිසි උපකාරක අංක පළ කිරීම ඉන් එකකි. හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ දිවි බේරා ගැනීමට ඉන් ඉඩක් ලැබෙනු ඇත.

එසේම, යම්කිසි තාවකාලික හෝ ස්ථිර ආබාධයක් සහිතව ජීවත්වන්නවුන් හැඳින්වීමේදී , ඔවුන්ව කොන් කෙරෙනා ආකල්පයක් ඇති නොකිරීම සඳහා පුද්ගල-මූලික භාෂාවක් භාවිතා කරනා ලෙසින්ද මාධ්‍ය දිරිමත් කෙරේ. ඒ අනුව "ආබාධිත" වැනි යෙදුමක් වෙනුවට, මෙම පුවතේ අන්තර්ගතයේ වඩාත් නිවැරදිව දක්වා ඇති පරිදි "ආබාධ සහිත" වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය වනු ඇත.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna